www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA

## පළමු වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

NALANDA VIDYALAYA

10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | ඒකකය 03 : ව්‍යාපාර සංවිධාන

- **පහත ප්‍රශ්ණ අංක 01 සිට 12 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.**

01) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී සලකනු ලබන නිර්ණායකයක් නොවන්නේ,

1) ව්‍යාපාරයක ප්‍රාග්ධන ප්‍රමාණය
2) ව්‍යාපාරයක සේවක සංඛ්‍යාව
3) ව්‍යාපාරයක ලාභ ප්‍රමාණය
4) ව්‍යාපාරයට අයත් වෙළෙඳපොළ කොටස

02) පහත දැක්වෙනුයේ ව්‍යාපාර සංවිධාන කිහිපයකි.

A - හවුල් ව්‍යාපාර
B - රාජ්‍ය සමාගම්
C - රාජ්‍ය දෙපාර්තමේන්තු
D - සමිති

මෙම සංවිධාන අතරින් ලාභ ලැබීමේ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන පමණක් අයත් පිළිතුර වනුයේ,

1) B, A සහ D වේ.
3) D, C සහ B වේ.
2) B සහ C වේ.
4) C සහ D වේ.

03) ඒකපුද්ගල ව්‍යාපාරයක දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,

1) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
2) නීතිමය පුද්ගලභාවයක් පැවතීම.
3) තනි අයිතිකරුවන් විසින් ප්‍රාග්ධනය යෙදවීම.
4) අයිතිකරුවාගේ වගකීම අසීමිත වීම.

04) හවුල් ව්‍යාපාරයක සිටිය යුතු සාමාජික සංඛ්‍යාව දක්වෙන පිළිතුර වනුයේ.

1) අවමය 02 උපරිමය 20
2) අවමය 20 උපරිමය 50
3) අවමය 05 උපරිමය 20
4) අවමය 05 උපරිමය 50

05) ඕනෑම ව්‍යාපාර සංවිධානයකට පොදු වූ ලක්ෂණයකි,

1) අඛණ්ඩ පැවැත්ම.
2) වගකීම සීමිත වේ.
3) නෛතික පුද්ගලභාවය.
4) අරමුණක් තිබීම.

06) හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන නිවැරදි වර්ගීකරණය කර ඇති පිළිතුර තෝරන්න.

1) පොදු අංශයේ ව්‍යාපාර සහ රාජ්‍ය අංශයේ ව්‍යාපාර
2) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර
3) පෞද්ගලික අංශයේ ව්‍යාපාර සහ මහා පරිමාණ ව්‍යාපාර
4) පෞද්ගලික අංශයේ සහ පොදු අංශයේ ව්‍යාපාර



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

07) "X" තීරුවේ ව්‍යාපාර සංවිධාන ද "Y" තීරුවේ ප්‍රකාශ කිහිපයක් ද සඳහන් වේ.

| X | Y |
|---|---|
| 1) හවුල් ව්‍යාපාර<br>2) සංස්ථාපිත සමාගම්<br>3) සමුපකාර සමිති<br>4) රාජ්‍ය සංස්ථා | A – ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම<br>B – ලියාපදිංචිය අනිවාර්ය වේ.<br>C – විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනතකින් ආරම්භ කෙරේ.<br>D – අවම සාමාජික සංඛ්‍යාව 02 උපරිම සාමාජික සංඛ්‍යාව 20 යි. |

ඉහත "X" තීරුව සමඟ පිළිවෙලින් "Y" තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ

1 B, D ,A සහ C වේ. 2. A , B,D සහ C වේ.

3 D, C, B සහ A වේ. 4 B, D, C සහ A වේ.

08) සමුපකාර සමිතියක් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1) ස්වාධීන සංවිධානයක් වීම. 2) 2007 අංක 07 පනත යටතේව ලියාපදිංචි වීම.

3) ප්‍රාග්ධනය රජය මගින් සැපයීම. 4) වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම.

09) සීමිත සමාගමක කළමණාකරණ කටයුතු සිදු කරනු ලබන්නේ,

1) සාමාජිකයන් මඟිනි. 2) ලේකම් මඟිනි.

3) කොටස්කරුවන් මඟිනි. 4) අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟිනි.

10) පහත සඳහන් ව්‍යාපාර අතරින් නෛතික පුද්ගලභාවයක් සහිත සංවිධානයක් නොවන්නේ,

1) රාජ්‍ය සංස්ථා 2) සීමිත සමාගම්

3) රාජ්‍ය දෙපාර්තමේන්තු 4) රාජ්‍ය මණ්ඩල

11) ''අ'' තීරුව මගින් ව්‍යාපාර සංවිධාන කිහිපයක් ද, ''ආ'' තිරුවේ ඒවාට නිදසුන් ද වේ.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1) කේවලස්වාමි ව්‍යාපාර<br>2) සමිති සංවිධාන<br>3) හවුල් ව්‍යාපාර<br>4) රාජ්‍ය සංස්ථා | A – දිලෙන තරු ළමා සමාජය<br>B – ජයබිම ස්ටෝර්ස්<br>C – ශ්‍රී ලංකා වරාය අධිකාරිය<br>D – විමලධර්ම සහෝදරයෝ |

''අ'' තීරුව සමඟ අනුපිළිවෙලින් ''ආ'' තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

i) B, A, D සහ C වේ. ii) D, A, B සහ C වේ.

iii) A, D, B සහ C වේ. iv) B, D, C සහ A වේ.

12) රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1) 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ආරම්භ කරයි.

2) ප්‍රාග්ධන සම්පාදනය, සාමාජික අරමුදල් මගින් සිදු කරයි.

3) විශේෂ පාර්ලිමේන්තු පනතක් මගින් ආරම්භ කරයි.

4) නෛතික පුද්ගලභාවයක් නැත.

Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ලියා දක්වන්න.**

13) සමූපකාර සමිතියක් ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණක් වනුයේ සාමාජිකයන්ගේ පොදු අවශ්‍යතා ඉටුකර ගැනීමයි. ........................

14) විදේශ සේවා නියුක්ති කාර්යාංශය, රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. ........................

15) සීමිත සමාගම්වල කොටස්හිමියන්ගේ වගකීම් අසීමිතය. ........................

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **පහත සිද්ධිය ඇසුරෙන් 01 සිට 08 දක්වා ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.**

**සංජය බණ්ඩාර, ''සංජය ටෙක්''** නමින් පරිගණක උපාංග අලෙවි කිරීමේ හා පරිගණක අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ඔහු එහි කළමණාකරු ද විය.

පරිගණක දෘඩාංග සහ මෘදුකාංග පිළිබඳ මනා අවබෝධයක් සහිත සංජය, පරිගණක පිළිබඳ උසස් ඩිප්ලෝමාධාරියෙකු වේ. ඔහුගේ පරිගණක පාඨමාලාවේ සමකාලීන මිතුරක් වූ **රයන්** ද මෙම ව්‍යාපාරය අරම්භ වී මාස 02 කට පසු රු. 100,000/- ක් යොදවමින් ව්‍යාපාරයට සම්බන්ධ විය. ඒ අනුව ආයතනයේ නම (R and S tech) **''ආර් ඇන්ඩ් එස් ටෙක්''** නමින් වෙනස් වූ අතර ලාභ බෙදා ගැනීම ඇතුළු කරුණු කිහිපයක් පිළිබඳ ලිඛිත ගිවිසුමක් ඔවුන් විසින් ඇතිකර ගන්නා ලදි.

01) නිෂ්පාදිතයේ ස්වභාවය අනුව ''සංජය ටෙක් '' අයත් වන **ව්‍යාපාර වර්ගය** කුමක්ද?

02) සංජය විසින් මුලින් ආරම්භ කළ ''සංජය ටෙක්'' හි **ව්‍යාපාර සංවිධාන වර්ගය** කුමක්ද?

03) ''සංජය ටෙක්'' ආයතනය ලියාපදිංචි කළ යුතුද? පැහැදිලි කරන්න.

04) ''සංජය ටෙක්'' ව්‍යාපාරයේ පවතින ශක්තීන් මොනවාද?

05) ''සංජය ටෙක්'' ව්‍යාපාරයට රයන් සම්බන්ධ වීමෙන් බිහි වූ **''ආර් ඇන්ඩ් එස් ටෙක්''** ව්‍යාපාරයේ සංවිධාන වර්ගය නම් කර එම සංවිධාන වර්ගයේ වාසි සහ අවාසි වෙන වෙනම ලියා දක්වන්න.

06) **''ආර් ඇන්ඩ් එස් ටෙක් ''** ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් තිබේද? පැහැදිලි කරන්න.

07) සංජය සහ රයන් අතර නව ව්‍යාපාර කටයුතු පිළිබඳ ඇති කරගත් ගිවිසුම හැඳින්වෙන නම කුමක්ද?

08) ''ආර් ඇන්ඩ් එස් ටෙක් '' (R and S Tech) ව්‍යාපාර සංවිධාන වර්ගයට අදාළව කටයුතු කරන පනත කුමක්ද?

09) ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමට යොදාගනු ලබන පදනම් (නිර්ණායක) මොනවාද?

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

- **පහත සඳහන් ප්‍රශ්ණවලට කෙටි පිළිතුරු සපයන්න.**

## ඒක පුද්ගල ව්‍යාපාර සහ හවුල් ව්‍යාපාර

10) ඒක පුද්ගල ව්‍යාපාරයක ලක්ෂණ 04 ක් ලියන්න.
11) ඒක පුද්ගල ව්‍යාපාරයක පවතින වාසි සහ අවාසි 02 බැගින් ලියන්න.
12) හවුල් ව්‍යාාරයක් යනු කුමක්ද?
13) රු 1000 හෝ ඊට වැඩි ප්‍රාග්ධනයක් සහිත හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ලිඛිත ගිවිසුමක් යටතේ ආරම්භ කළ යුතු බව සඳහන් පනත කුමක්ද?
14) ''හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචිය අනිවාර්ය නොවේ'' මෙම ප්‍රකාශය සත්‍ය ද, අසත්‍ය ද? පැහැදිලි කරන්න.

## සංස්ථාපිත සමාගම්

15) සංස්ථාපිත සමාගමක් යනු කුමක්ද?
16) සමාගමක් සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් බලපාන නීතිය කුමක්ද?
17) සංස්ථාපිත සමාගම්වල ලක්ෂණ 03 ක් ලියන්න.
18) සංස්ථාපිත සමාගම්වල වාසි සහ අවාසි 02 බැගින් ලියන්න.

## සමුපකාර සමිති

19) සමුපකාර සමිතියක් ආරම්භ කිරීම සඳහා සිටිය යුතු අවම සාමාජික සංඛ්‍යාව කොපමණද?
20) නව සමුපකාර සමිතියක් ලියාපදිංචි කළ යුත්තේ කුමන පනතක් යටතේද?
21) සමුපකාර සමිතියක ලක්ෂණ 03 ක් ලියා දක්වන්න.
22) සමුපකාර සමිතියක ප්‍රධානම අරමුණ කුමක්ද?
23) සමුපකාර සමිතියක වාසි සහ අවාසි 02 බැගින් ලියන්න.
24) ''සමිති'' ව්‍යාපාර සංවිධානයක ප්‍රධාන අරමුණ කුමක්ද?
25) ''සමිති'' ව්‍යාපාර සංවිධාන සඳහා උදාහරණ 02ක් ලියන්න.

## රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය දෙපාර්තමේන්තු

26) රාජ්‍ය සංස්ථාවල විශේෂ ලක්ෂණ මොනවාද?
27) රාජ්‍ය සංස්ථාවල වාසි සහ අවාසි 02 බැගින් ලියන්න.
28) රාජ්‍ය සංස්ථා සඳහා උදාහරණ 02ක් ලියන්න.
29) රාජ්‍ය දෙපාර්තමේන්තුවල විශේෂ ලක්ෂණ 03 ක් ලියන්න.
30) රාජ්‍ය දෙපාර්තමේන්තුවල වාසි සහ අවාසි 02 බැගින් ලියන්න.
32) යෝග්‍ය ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක මොනවාද?
33) ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමේ බලධරයා වනුයේ කවුරුන්ද?
34) ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන මොනවාද?
35) ව්‍යාපාර නාමයන් ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන 02 ක් ලියා දක්වන්න.

සැකසුම = බී.එස්. ඉමේෂා ලක්ෂ්මන්